## කුරුණෑගල ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ පවතින රියදුරු, විදුලි කාර්මික තනතුරු සඳහා බඳවා ගැනීම

කුරුණෑගල, මල්පිටිය, බෝයගනේ ප්‍රාදේශීය සභාවට රියදුරු සහ විදුලි කාර්මික තනතුරු සඳහා අදාළ සුදුසුකම් ලබා ඇති, කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස්කල ඉල්ලුම්පත් 2019.04.06 දිනට පෙර "ලේකම්, කුරුණෑගල ප්‍රාදේශීය සභාව, මල්පිටිය, බෝයගනේ" ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් කෙලවර ඉහළ කොටසේ කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

| *තනතුර* | *පුරප්පාඩු* |
|---|---|
| විදුලි කාර්මික | 02 |
| රියදුරු | 02 |

(i) මතු දක්වෙන ආකෘතියේ ප්‍රකාර පිළියෙල නොවූ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
(ii) ඉල්ලුම්පත් තැපැලේ දී නැතිවීම හෝ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් ගැන වගකීම තමන් විසින් ම භාරගත යුතුය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) එසේම රාජ්‍ය සේවා පත්කිරීම්වලට අදාල වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.
(iii) සියළුම සේවකයින් ස්ථාන මාරුවීම්වලට යටත් වන අතර, වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ කවර හෝ ආයතනයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය. (පළාත් පාලන ආයතන හැර)

*වෙනත් කොන්දේසි :*

තෝරාගනු ලබන සේවකයින් (03) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. එම කාල සීමාව තුළ වැඩ හැසිරීම, පැමිණීම, සතුටුදායක තත්වයක නොමැති වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

*වැටුප් පරිමාණය :*

PL 3 - 2016 රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 -රු. 38,990.00

*වයස් සීමාව :*

තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු හා වයස 45ට නොවැඩි විය යුතුය. දැනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.



*අධ්‍යාපන සුදුසුකම් :*

බාහිර අයදුම්කරුවන් සඳහා :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05 ක් සමත් විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

දැනට ස්ථිර සේවයේ නියුතු අය රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. එහෙත් මෙම තනතුරු සඳහා අනියම් / ආදේශක / දීමනා මත / කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.

ශිල්පීය නිපුණතා /ප්‍රවීණතා හා පළපුරුද්ද :-

**විදුලි කාර්මික තනතුර සඳහා :**

තනතුරේ කාර්ය භාරයට අදාළ තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

පළපුරුද්ද :

පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර තුනක (03) පළපුරුද්දක් තිබීම. (සේවා සහතික මගින් සනාථ කළ යුතුවේ.)

**රියදුරු තනතුරු සඳහා :**

භාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)

පළපුරුද්ද :

වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.)

*මූලික සුදුසුකම් :-*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වසර 03ක් කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. ඒ බව පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලිපියකින් සනාථ කළ යුතුය.

*වෙනත් සුදුසුකම් :-*

(i) සෑම බඳවාගැනීමක් සම්බන්ධයෙන් ම ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.

(ii) සම්මුඛ පරීක්ෂණයේ (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ) ප්‍රතිඵල මත සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(iii) සේවයට බඳවා ගැනීම ආයතන ප්‍රධානියා විසින් සිදු කරනු ලැබේ.

(iv) ඉහත සඳහන් රෙගුලාසිවලට අඩංගු නොවන්නා වූ යම් කරුණක් වෙතොත් ප්‍රාදේශීය සභා ලේකම් තුමාගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියාකරනු ඇත.



(v) තනතුරු සඳහා බඳවා ගැනීමේ දී මෙම ආයතනයේ ස්ථිර / අනියම් / ආදේශක / දීමනා මත / කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති අය වෙනුවෙන් ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය, බෝයගනේ, කුරුණෑගල.

2019 මාර්තු මස 07 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

### ආදර්ශ අයදුම්පත්‍රය

ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම - කුරුණෑගල ප්‍රාදේශීය සභාව
........................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————
2. මුලකුරු සමග නම :——————————
3. ස්ථිර ලිපිනය:——————————
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————
5. උපන් දිනය :- අවුරුද්ද :———— මාසය :———— දිනය :————
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :———— මාස :———— දින :————
7. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
8. විවාහක/අවිවාහක බව:——————————
9. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද? උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න (ලියාපදිංචි යෙන් නම් විස්තර සපයන්න)
11. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

අ.පො.ස. සාමාන්‍ය පෙළ :

විභාග අංකය :———— වර්ෂය :————

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. උසස් පෙළ :

විභාග අංකය :———— වර්ෂය :————

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |



12. වෙනත් අධ්‍යාපන සුදුසුකම් (සහතික වල ඡායා පිටපත් ඇමිණිය යුතුය.)
13. උසාවියෙන් යම් වරදකට වරදකරු කර තිබේ ද? :————

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කර සිටිමි. මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් හෝ පත්වීම ලැබීමෙන් පසු හෝ නුසුදුසු භාවය ඔප්පු වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් ප්‍රකාශ කර සිටිමි.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

03 - 1110/2

Source: Government Gazette (2019.03.22)